2027 ඒකාබද්ධ රියදුරු සේවයේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල රැස්වීම - 2027.10.14
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධරයින්ගේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල රැස්වීම 2026.10.14 දින පෙ.ව.09.30 ට අමාත්‍යාංශයේදී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

අභියාචනා මණ්ඩලය :

එම්.ඒ. රණවක මිය - සභාපති
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

ඊ.එම්.යූ.එස්. ඒකනායක මහතා - සාමාජික
ප්‍රධාන ගණකාධිකාරි

බී.බී.අයි.ඒ. පෙරේරා මිය - සාමාජික
අධ්‍යක්ෂ

වෘත්තීය සමිති නියෝජිතයින් :

ටී.එස්.එස්. වීරබද්දන මහතා - ප්‍රධාන ලේකම්, ලංකා රාජ්‍ය රියදුරු සංගමය
ඩබ්. හසන් ප්‍රනාන්දු මහතා - ප්‍රධාන ලේකම්, සමස්ත ලංකා රජයේ රියදුරු සංගමය
ඒ.එම්.එල්. දීපාල් මහතා - භාණ්ඩාගාරික, පොදු සේවක සංගමය
ටී.එච්.ඒ. රෝහිත මහතා - සාමාජික, සමස්ත ලංකා රජයේ රියදුරු සංගමය

2027 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු තීරණ වලට අදාළව ඉදිරිපත් කර තිබූ අභියාචනා සහ ඒ සඳහා අභියාචනා මණ්ඩලය විසින් ලබා දෙන ලද තීරණ පහත පරිදි වේ.

අනු අංකය	අභියාචනය	ඉදිරිපත් කර ඇති නිලධරයා	අභියාචනා මණ්ඩල තීරණය
01	2027.01.01 දිනට වයස අවුරුදු 58 ඉක්මවා ඇති බැවින්, වයස අවුරුදු 55 ඉක්මවා ඇති නිලධරයින් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබා දීමට ඇති පොරොත්තු ලේඛනයෙන් ප්‍රමුඛතාවයක් ලබා ගැනීම	ටී.එච්.ඒ. රෝහිත මයා (රියදුරු I) ජාතික අයවැය දෙපාර්තමේන්තුව	*විශ්‍රාම යාමට ආසන්න නිලධරයෙකු ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් සලකා බලනු ලබන්නේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10:2 අනුපාතය යටතේ පොරොත්තු ලේඛනයේ රැඳී සිටින අනුපිළිවෙල අනුවය. *එම ක්‍රමයට පරිබාහිරව ප්‍රමුඛතාවය ලබා දීම තුළින් වයස අවුරුදු 55 ඉක්මවූ අනෙකුත් නිලධාරීන්ට අගතියක් සිදුවන අතර ස්ථාන මාරු ක්‍රමවේදය අවිධිමත් වීම ද සිදුවේ. *එබැවින් 2027 වර්ෂයේ ස්ථාන මාරු ලබාදීමේදී මෙම රියදුරු මහතා හට ප්‍රමුඛතාවය ලබා දීමට නොහැකි බව

අනු අංකය	අභියාචනය	ඉදිරිපත් කර ඇති නිලධරයා	අභියාචනා මණ්ඩල තීරණය
02	මුදල් අමාත්‍යාංශයට 2022.02.01 දින පැමිණියද ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ පැමිණි දිනය 2022.04.28 ලෙස සඳහන් කර ඇති බැවින් එම දිනය 2022.02.01 ලෙස සංශෝධනය කර ගැනීම	එච්.ඩී. යුශාන්ත පුෂ්පකුමාර මයා (රියදුරු I) මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	* ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 2022.02.01 දින වන විට මුදල් අමාත්‍යාංශ විෂය පථය යටතට අයත් නොවූ බවත් එය 2022.04.28 දින මුදල් අමාත්‍යාංශ විෂය පථය යටතට ඇතුළත්ව ඇති බවත් නිරීක්ෂණය කරන ලදී. * එබැවින් පොරොත්තු ලේඛනයේ අමාත්‍යාංශයට පැමිණි දිනය 2022.02.01 ලෙස සංශෝධනය කිරීමට හැකියාවක් නොමැති බව
	වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2028.08.09 දින විශ්‍රාම යාමට නියමිත බැවින් පොරොත්තු ලේඛනයේ ප්‍රමුඛතාවය ලබා ගැනීම	එච්.ඩී. යුශාන්ත පුෂ්පකුමාර මයා (රියදුරු I) මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	*විශ්‍රාම යාමට ආසන්න නිලධරයෙකු ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් සලකා බලනු ලබන්නේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10:2 අනුපාතය යටතේ පොරොත්තු ලේඛනයේ රැඳී සිටින අනුපිළිවෙල අනුවය. *එම ක්‍රමයට පරිබාහිරව ප්‍රමුඛතාවය ලබා දීම තුළින් වයස අවුරුදු 55 ඉක්මවූ අනෙකුත් නිලධාරීන්ට අගතියක් සිදුවන අතර ස්ථාන මාරු ක්‍රමවේදය අවිධිමත් වීම ද සිදුවේ. *එබැවින් 2027 වර්ෂයේ ස්ථාන මාරු ලබාදීමේදී මෙම රියදුරු මහතා හට ප්‍රමුඛතාවය ලබා දීමට නොහැකි බව
03	2020.02.20 දින මුදල් අමාත්‍යාංශයට ස්ථාන මාරු වී පැමිණියද පොරොත්තු ලේඛනයේ පැමිණි දිනය 2020.02.21 ලෙස සඳහන් වීම හා රියදුරු I පන්තියේ වුවද II පන්තිය ලෙස පොරොත්තු ලේඛනයේ සඳහන් වීම නිසා එය නිවැරදි කර ගැනීම	සී.එස්. බුද්ධකෝරාළ මයා (රියදුරු I) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	*මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF1/1/9/Annual Tra/2020 හා 2020.02.20 දිනැති ලිපිය සහ රජයේ ප්‍රධාන තක්සේරුකරු ගේ අංක ඊබී04/වා.ස්.මා(අභ්‍ය)./2020 හා 2020.02.24 දිනැති ලිපි අනුව සී.එස්. බුද්ධකෝරාළ මහතා 2020.02.20 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කළ බව තහවුරු වී ඇත. *එබැවින් පොරොත්තු ලේඛනයේ සී.එස්. බුද්ධකෝරාළ මහතා මුදල් අමාත්‍යාංශයට පැමිණි දිනය 2020.02.20 ලෙස සංශෝධනය කිරීම *එම දිනය හා රියදුරු මහතාගේ ජ්‍යෙෂ්ඨතාවය සැලකිල්ලට ගෙන ඒ මහතා පොරොත්තු ලේඛනයේ නිසි ස්ථානයේ ස්ථානගත කිරීම *සී.එස්. බුද්ධකෝරාළ මහතා රියදුරු II පන්තිය පොරොත්තු ලේඛනයේ සඳහන් වී ඇති අතර එය රියදුරු I පන්තිය ලෙස සංශෝධනය කිරීම

අනු අංකය	අභියාචනය	ඉදිරිපත් කර ඇති නිලධරයා	අභියාචනා මණ්ඩල තීරණය
04	ඒ.සේ.අ.ස. ගේ ස්ථාන මාරු නියෝග අනුව 2026.08.05 දින ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කළද ඒ වන විට 2027 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් භාර ගැනීම අවසන් වී ඇති බැවින් පොරොත්තු ලේඛනයට නම ඇතුළත් කර ගැනීම	එම්.ආර්.එම්.ඒ.බී. රත්නායක මයා (රියදුරු III) ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව	*2027 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවීම 2026.07.31 දිනෙන් අවසන් වී ඇති බැවින් එදිනෙන් පසුව ඉදිරිපත් කරන අයදුම්පත් නොසලකා හරිනු ලැබේ. *එබැවින් 2027 පොරොත්තු ලේඛනය සඳහා මෙම රියදුරු මහතාගේ නම ඇතුළත් කිරීමට හැකියාවක් නොමැති බව *රේගු දෙපාර්තමේන්තුව වෙත අභ්‍යන්තර ස්ථාන මාරු කිරීමේ පොරොත්තු ලේඛනයට නම ඇතුළත් කර ගැනීම සඳහා 2028 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවීම් සිදු කළ පසුව අයදුම්පත් යොමු කළ යුතු බව *එහිදී සේවයට වාර්තා කළ 2026.08.05 දිනටම පොරොත්තු ලේඛනයට ඔහුගේ නම ඇතුළත් කිරීම
05	ස්ථාන මාරු ලබා 2022.05.23 දින මුදල් අමාත්‍යාංශයට පැමිණි පසු 2022.05.26 දින සිට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත අභ්‍යන්තර අනුයුක්ත කර ඇත. පත්වීම ස්ථිර කරන තෙක් එවකට ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කර නොමැත. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කීපදෙනෙක් පොරොත්තු ලේඛනයට ඇතුළත් වන බැවින් තම නමද එම ලේඛනයට ඇතුළත් කර ගැනීම	බී.එම්.ඩී. රණසිංහ මයා (රියදුරු III) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් වැඩිදුර උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම උචිත බව

එසේම අනු අංක 03 යටතේ නම් සඳහන් සී.එස්. බුද්ධකෝරාළ මයා පොරොත්තු ලේඛනයේ නිසි පරිදි ස්ථානගත කිරීම හේතුවෙන් 2027 වර්ෂය සඳහා රේගු දෙපාර්තමේන්තුව වෙත අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලද නිලධරයන්ගේ ලේඛනය ද සංශෝධනය විය යුතුය.

එම්.ඒ. රණවක
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

එම්.ඒ. රණවක
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01

ඊ.එම්.යූ.එස්. ඒකනායක
ප්‍රධාන ගණකාධිකාරී
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

ඊ.එම්.යූ.එස්. ඒකනායක
ප්‍රධාන ගණකාධිකාරී
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

බී.බී.අයි.ඒ. පෙරේරා
අධ්‍යක්ෂ
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

අනුරාධි පෙරේරා
අධ්‍යක්ෂ (රා:ඉ:)
ආයතනික කටයුතු අංශය
මුදල්, ක්‍රමසම්පාදන සහ
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01